ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1979 අංක 31 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 31 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 25/79.

**මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 31 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන මෝටර් වාහන පනතෙහි 151 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 203 වන අධිකාරයෙහි 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මත්පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගැනීමෙන් පසු කිසිම තැනැත්තකු විසින් මහා මාර්ගයක මෝටර් වාහනයක් පැදවීම නොකළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(1අ) කිසිම තැනැත්තකු විසින් මත්පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගැනීමෙන් පසුව ගාස්තුවක් හෝ ත්‍යාගයක් සඳහා තැනැත්තන් ගෙන යාමට අදහස් කොට ඇති යම් බස් රථයක් හෝ කුලී මෝටර් වාහනයක් හෝ වෙනත් යම් වාහනයක් මහා මාර්ගයක පැදවීම නොකළ යුතු ය.

(1ආ) මත්පැන් හෝ මත් ද්‍රව්‍ය කිසිවක් ගැනීමෙන් පසුව මහා මාර්ගයක මෝටර් වාහනයක් පදවා ඒ මගින් යම් තැනැත්තකුට මරණය හෝ තුවාල හෝ සිදු කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(1ඇ) (අ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියැදුරු මත්පැන් ගෙන ඇති බවට පොලිස් නිලධරයකු විසින් සැක කරනු ලබන අවස්ථාවක, මත්පැන් පානයකොට ඇත්තේ ද යන වගට ප්‍රශ්වාස පරීක්ෂණයකට වහාම භාජන වන ලෙස, ඒ පොලිස් නිලධරයා විසින්, ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තා ඒ නියමයට අනුව ක්‍රියා කළ යුතු ය.

(ආ) ඒ තැනැත්තා මත්පැන් ගෙන ඇති බව මත්පැන් ප්‍රශ්වාස පරීක්ෂණයෙන් හෙළිවන්නාවූ අවස්ථාවක හෝ ඒ පරීක්ෂණයට භාජන වීමට ඒ තැනැත්තා ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ අවස්ථාවක පටහැනිව සාක්ෂි ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා මත්පැන් ගෙන ඇති බව පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(ඇ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියැදුරු මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට පොලිස් නිලධරයකු විසින් සැක කරනු ලබන අවස්ථාවක, පරීක්ෂා කරනු ලැබීම සඳහා

ඒ 41787—11,750 (79/05)

ඒ තැනැත්තා ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු වෙත පොලිස් නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු අතර, ඒ තැනැත්තා ඒ නියමයට අනුව ක්‍රියා කළ යුතු ය.

(ඇ) මහා මාර්ගයක මෝටර් වාහනයක රියැදුරු මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට වූ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකුගේ වාර්තාව, පටහැනිව සාක්ෂි ඉදිරිපත් කර ඇත් නම් මිස, ඒ තැනැත්තා මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

(ඉ) ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු විසින් කරනු ලබන එවැනි යම් පරීක්ෂණයකට භාජන වීම ඒ තැනැත්තා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, පටහැනිව සාක්ෂි ඉදිරිපත් කර ඇත් නම් මිස, මත් ද්‍රව්‍ය ගැනීමෙන් පසුව ඔහු රිය පදවමින් සිටි බවට පූර්ව නිගමනය කළ යුතු ය.

(1ඇ) (i) මත්පැන් ප්‍රශ්වාස පරීක්ෂණය පැවැත්විය යුතු ක්‍රමය සහ ආකාරය ද;

(ii) තැනැත්තකු මත්පැන් ගෙන ඇතැයි සලකනු ලැබිය යුත්තේ ඒ තැනැත්තාගේ රුධිරයෙහි යම් ප්‍රමාණයක හෝ ප්‍රමාණයක් ඉක්මවන මද්‍යසාර සාන්ද්‍රණයක් තුබුණහොත් ද ඒ ප්‍රමාණය ද;

(iii) මෝටර් වාහනයක රියැදුරකු මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන තිබේ ද යන්න නිශ්චය කිරීම සඳහා යම් පරීක්ෂණයක් පවත්වනු ලැබිය හැකි ක්‍රමය සහ ආකාරය ද; සහ

(iv) තැනැත්තකු මත් ද්‍රව්‍ය කිසිවක් ගෙන ඇතැයි සලකනු ලැබිය යුත්තේ ඒ තැනැත්තාගේ රුධිරයෙහි යම් ප්‍රමාණයක හෝ යම් ප්‍රමාණයක් ඉක්මවන මත් ද්‍රව්‍ය සාන්ද්‍රණයක් තුබුණහොත් ද ඒ ප්‍රමාණය ද

නියම කරමින් නියෝග සෑදනු ලැබිය හැකි ය."; තවද

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට, පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන්:—

"මත්පැන් හෝ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය පැදවීම සහ අපරීක්ෂාකාරීව නැතහොත් නොසැලකිලිමත් ලෙස රිය පැදවීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මත්පැන් හෝ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් දණ්ඩනය.

216. 151 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසකට අඩු නොවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන

කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩයට සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා ඔහුගේ රිය පැදවීමේ බලපත්‍රය අත්හිටුවනු ලැබීමට ද ඔහු යටත් විය යුතු ය.".

216 අ සහ 216 ආ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 216 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති 216අ සහ 216ආ වගන්ති ලෙස බල පැවැත්විය යුතුය:—

"මත්පැන් හෝ මත් ද්‍රව්‍ය ගැනීමෙන් පසු ඇතුම් මෝටර් වාහන පැදවීම සම්බන්ධයෙන් දණ්ඩනය.

216අ. 151 වන වගන්තියේ (1අ) උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන් දහසකට අඩු නොවන දඩයකට සහ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ද ඔහුගේ රිය පැදවීමේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද ඔහු යටත් විය යුතු ය.

මත්පැන් හෝ මත් ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය පැදවීමෙන් තැනැත්තන්ට මරණය හෝ තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

216ආ. 151 වන වගන්තියේ (1ආ) උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමේ වරදට වරදකරු වන යම් තැනැත්තකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට—

(අ) ඒ තැනැත්තා විසින් යම් තැනැත්තකුගේ මරණය සිදු කරනු ලබන අවස්ථාවක අවුරුදු දෙකකට නො අඩුවන්නා වූ ද අවුරුදු දහයක් නො ඉක්මවන්නා වූ ද කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ද ඔහුගේ රිය පැදවීමේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද;

(ආ) ඒ තැනැත්තා විසින් යම් තැනැත්තකුට තුවාල සිදු කරනු ලබන අවස්ථාවක රුපියල් පන් දහසකට නොඅඩු දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඔහුගේ රිය පැදවීමේ බලපත්‍රය අවලංගු කරනු ලැබීමට ද

යටත් විය යුතු ය.".